# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අවශ්‍ය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් 2021 මාර්තු 20 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

කථිකාචාර්ය (පරිවාස) / කථිකාචාර්ය (ස්ථිර නොවන)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය

**ක්ෂේත්‍ර :**

**ආයුර්වේද/ යුනානි/ සම සෞඛ්‍ය විද්‍යා**

(මෞලික සිද්ධාන්ත සම්හිතා/ ශාලක්‍ය/ ස්වස්ථවෘත්ත හා යෝග/ අගදතන්ත්‍ර/ රසශාස්ත්‍ර හා භෛෂජ්‍ය කල්පනා/ ශරීර රචනා/ ශරීර ක්‍රියා / දව සාසි (සයිඩිලා) / ඉල්මුල්ජරාහට්/ MBBS සමග අදාළ ක්ෂේත්‍රයේ PG සුදුසුකම් සහිත MD/Mphil/phd උපාධි සතු අයහට ප්‍රමුඛතාව හිමිවේ.)

**වැටුප් පරිමාණය (2020.01.01 දිනට)**

1. **U-AC3(IV) කථිකාචාර්ය (ආධුනික) :**
   **රුපියල් 54,600-10X1,335 - 67,950/= (මසකට)**
2. **U-AC 3 (III) : කථිකාචාර්ය (ස්ථිර නොකළ) :**
   **රුපියල් 69,580 - 5X1,630 - 77,730/= (මසකට)**
3. **U-AC 3 (II) : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය :**
   **රුපියල් 79,360 - 11X1,630 - 97,290/= (මසකට)**
4. **U-AC 3 (I) : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය :**
   **රුපියල් 91,310 - 7X2,170 - 106,500/= (මසකට)**

**වෙනත් ප්‍රතිලාභ**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය / II ශ්‍රේණිය සඳහා වසර හතක සේවා සම්පූර්ණ කිරීමෙන් පසුව පූර්ණ වැටුප් සහිත වසර එකක කාලයක් සඳහා සප්ත වාර්ෂික නිවාඩු හිමිවේ.
2. විශ්‍රාම ගැනීමේදී/ සේවය අවසන් කිරීමේදී ලබා දෙනු ලබන පාරිතෝෂික දීමනාව, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතෙහි විධිවිධාන ප්‍රකාරව වේ.
3. සේවායෝජක විසින්, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා විශ්‍රාම වැටුප් අරමුදලට සේවකයාගේ වැටුපට අදාළ 7% හා 8 % බැගින් වූ ලෙස දායකත්වයක් දරනු ලබයි.
4. එයට අමතරව සේවායෝජක විසින්, සේවක භාර අරමුදලටද සේවකයාගේ වැටුප ප්‍රකාරව 3% ක දායකත්වයක් ලබාදේ.

**අයදුම්කිරීමේ ක්‍රමවේදය :** අවශ්‍ය වැඩිදුර විස්තර, ආයතනයේ ආයතනික ශාඛාවේ සහකාර ලේඛකාධිකාරී වෙතින් (දුරකතනය – 0112687063) කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකිය. අදාළ අයදුම්පත් ලබාගැනීමත් තනතුරට අදාළ සුදුසුකම් අවශ්‍යතා බලාගැනීමත් ආයතනයේ වෙබ් අඩවිය වන www.iim.cmb.ac.lk වෙතින් බාගත කළ හැක.

යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, සහකාර ලේඛකාධිකාරී / ආයතනික ශාඛාව, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය යන ලිපිනයට එවීමෙන් හෝ ඊමේල් recruit@iim.cmb.ac.lk වෙත අයදුම්පතෙහි මෘදු පිටපතක් (PDF හා WORD) යොමු කිරීමෙන් 2021 මාර්තු 20 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ සහතික පත්වල පිටපත් අමුණා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ සේවයේ සංස්ථාවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

**සටහන :** ඇබෑර්තු පවත්නා තනතුරු සංඛ්‍යාවට වැඩියෙන් අයදුම්පත් ලැබූ අවස්ථාවන්හිදී අවශ්‍ය මූලික සුදුසුකම් සහ / හෝ පළපුරුද්ද අපේක්ෂිත ප්‍රමාණයට හෝ ඉන් ඉහළට සතු අය කෙටි ලැයිස්තුගත කිරීමට ඇති අයිතිය ආයතනය සතුවේ.

**අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,**
**රාජගිරිය,**

**2021.02.16**

Source: Silumina, Sunday Observer (2021.02.21), Application: www.iim.cmb.ac.lk (2021.02.22)